**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (**පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතිය) අදියර 01 - 2015

------------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ( පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතිය ) අදියර 01 හි 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා එවකට ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා ජපන් බැංකුව වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 89 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ නාගරික කලාපයේ ප්‍රවාහන තදබදය අවම කිරීම හා වෙනත් ප්‍රදේශවල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා දකුණු අධිවේගී මාර්ගයට හා කොළඹ නගරයෙන් දිවෙන වෙනත් ජාතික මාර්ග වලට සම්බන්ධ වන කොළඹ අවට මහා මාර්ගයක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 26,263 කට සමාන ජපන් යෙන් මිලියන 29,182 ක් වන අතර ඉන් රු.මිලියන 18,966 කට සමාන ජපන් යෙන් මිලියන 21,074 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2013 මැයි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2015 අප්‍රේල් 30 දින නිම කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් හා ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නොසැසඳු ශේෂ

පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතියේ අදියර II හා අදියර III සමඟ ව්‍යාපෘතිය විසින් පවත්වන ලද ජංගම ගිණුම්වල දැක්වෙන පිළිවෙලින් රු.මිලියන 676.08 ක් හා රු.මිලියන 984.91 ක් වූ ගෙවිය යුතු ශේෂ, පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතියේ අදියර II හා අදියර III විසින් පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුම්වල දැක්වෙන පිළිවෙලින් රු.මිලියන 552.07 ක් හා රු.මිලියන 1,984.23 ක් වූ ශේෂ සමඟ එකඟවී නොතිබුණි.

#### 2.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

මාර්ග සංවර්ධන අධිකාරියේ 2003 පෙබරවාරි 27 දිනැති අංක 250 දරන මුදල් චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ව්‍යාපෘතිය විසින් භාවිතා කරන ලද සියලු වත්කම් හා ඉන්වෙන්ට්‍රි මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද බවට තහවුරු කර ගැනීම ව්‍යාපෘති අධ්‍යක්ෂගේ වගකීම වේ. තවද, එක් ව්‍යාපෘතියකින් තවත් ව්‍යාපෘතියකට වත්කම් භාරදීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම් අදාළ පාර්ශවයන්ගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව වෙනත් ව්‍යාපෘති වලට මාරු කර තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

රු.මිලියන 44.03 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරු මඟින් ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 14 ක් මාරු කරන ලද දිනයන් හා ඒවා භාරගන්නා ලද මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් යනාදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.** **මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1** **අරමුදල් උපයෝජනය**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන් කරන ලද මුදල | උපයෝජනය කළ අරමුදල් 2015 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන්යෙන් | රු.මිලියන | රු.මිලියන | ජපන්යෙන් මිලියන | රු.මිලියන | ජපන්යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 21,074 | 18,966 | 2,231 | 1,858 | 2,175 | 21,923 | 27,785 |
| ශ්‍රීලංර | 8,108 | 7,297 | 85 | 90 | 106 | 5,035 | 6,345 |
| එකතුව | 29,182 | 26,263 | 2,316 | 1,948 | 2,281 | 26,958 | 34,130 |

**3.2** **භෞතික ප්‍රගතිය**

2009 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද කඩුවෙල සිට කඩවත දක්වා අධිවේගී මාර්ගයේ අදියර 01 හි ඉදිකිරීම් වැඩ රු.මිලියන 1,428.83 ක පිරිවැයකට නිමකර තිබූ අතර 2014 මාර්තු 08 දින මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර තිබුණි. කෙසේ වුවද , ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යයන් 2015 අප්‍රේල් 30 දක්වා අඛණ්ඩව සිදුකර තිබුණි.

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩවල විෂය පථය නිරන්තරයෙන් වෙනස් කර තිබූ බව නිරීක්ෂණය විය. ලැබුණු තොරතුරු අනුව, රු.මිලියන 4,662 ක් වටිනා සිවිල් වැඩ, විචලන නියෝග 170 ක් මඟින් ආරම්භකව සැලසුම් කරන ලද වැඩ විෂය පථයෙන් ඉවත් කර තිබූ අතර, රු.මිලියන 80.59 ක් වටිනා අතිරේක වැඩ වෙනත් විචලන නියෝග 06 ක් යටතේ සිදුකර තිබුණි. තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අතුරුගිරිය අන්තර් හුවමාරුව හා කඩුවෙල ස්ථිර අන්තර් හුවමාරුව ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ විචලනයන් ලෙස පසුව හඳුන්වා දෙන ලදී. කෙසේ වුවද , එම කොන්ත්‍රාත්කරුටම පිළිවෙලින් රු.මිලියන 2,077 කට රු.මිලියන 475 කට වෙනම කොන්ත්‍රාත්තු ලබා දී තිබුණි. ව්‍යාපෘති ඉංජිනේරුවන් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව, ඉහත සඳහන් අන්තර් හුවමාරුවල ඉදිකිරීම් වැඩ පිළිබඳ විශාල විචලනයන් කිහිපයක් පිළිවෙලින් අවස්ථා 29 කදී හා අවස්ථා 23 කදී කොන්ත්‍රාත්කරුවන් විසින් පූර්ව අනුමැතිය නොමැතිව සිදුකර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ අදියර II යටතේ කඩුවෙල කොතලාවලහි අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් වැඩ සිදුකිරීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ස්ථිර අන්තර් හුවමාරුව ඉදිකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 126.34 ක පිරිවැයකට තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකර තිබුණි. පසුව තාවකාලීන අන්තර් හුවමාරුව රු.මිලියන 10.10 ක පිරිවැයකට කඩා ඉවත් කර තිබුණි.

(iii) උප කොන්ත්‍රාත්කරුවකු මඟින් රු.මිලියන 12.29 ක පිරිවැයකට විචලන නියෝගයන් යටතේ සිදුකරන ලද පදික ඉදිකිරීම පිළිබඳ අතිරේක වැඩ හා අතුරුගිරිය අන්තර් හුවමාරුවේ ඇස්පල්ට් ඇතිරීම පිළිබඳ අතිරේක වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් කොන්දේසි 59.1 වගන්තිය ප්‍රකාරව අදාළ පාර්ශවයන් සමඟ එකඟත්වය ලබාගෙන නොතිබුණි.

(ආ) අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ සඳහා ගුණාත්මක තත්ත්ව අනුගමනය කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ විගණනයේදී නිරීක්ෂණය වූ දුර්වලතා පහත විස්තර කරනු ලැබේ.

(i) ඉදිකිරීම් කොන්ත්‍රාත්වල විධිවිධාන අනුව, මාර්ග ඉදිකිරීම් කාර්යය සඳහා ගුණාත්මක සහතික පද්ධතියක් කොන්ත්‍රාත්කරු විසින් අනුගමනය කළ යුතු අතර, ඒ සඳහා ගුණාත්මක තත්ත්ව සහතික කාර්ය මණ්ඩලයක් සැලසුම් කර කොන්ත්‍රාත්කරු විසින් බඳවා ගත යුතුය. කෙසේ වුවද, ඉහත අවශ්‍යතාවයට කොන්ත්‍රාත්කරු අනුකූල වී නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ උපදේශක විසින් තත්ත්ව සහතික කාර්යයන් සඳහා අතිරේක කාර්ය මණ්ඩලයක් යොදවා තිබූ අතර විචලන නියෝගයන් මාර්ගයෙන් රු.මිලියන 6.91 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ii) පයිල් කැප්ස් (Pile Caps ), පියර්ස් (Piers) හා අබියුට්මන්ට්ස් (abatements) ආදියෙහි විශාල කොන්ක්‍රීට් මත උෂ්ණත්ව පාලනය සඳහා යාන්ත්‍රණයක් මුල් ප්‍රමාණ බිල්පත්‍රවල විධිමත්ව නිශ්චය කර නොතිබුණි. එබැවින් උෂ්ණත්ව පාලනයන් සඳහා යාන්ත්‍රණයක් අනුගමනය කිරීමට හා ගුණාත්මක ප්‍රමිතීන් අනුගමනය කිරීමට විචලන නියෝගයක් යටතේ රු.මිලියන 49.88 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(iii) මහා මාර්ගයේ නඩත්තු වැඩ පිළිබඳ වූ සැලකිය යුතු අඩුපාඩු පිළිබඳව 2012 ජූනි සිට 2014 සැප්තැම්බර් දක්වා උපදේශක විසින් අනනුකූල නිෂ්පාදන දැන්වීම් 05 ක් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය වූ අතර, හඳුනාගත් දෝෂ පිළියම් කිරීම සඳහා කටයුතු කළ බවට තහවුරු කිරීම සඳහා සාක්ෂි 2015 දෙසැම්බර් 31 වන විටත් විගණනයට ලැබී නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් කොන්දේසි 62.2 වගන්තියේ දක්වා ඇති පරිදි වටිනාකම රු.මිලියන 200 ඉක්මවන අතුරු ගෙවීම් සහතික ඇගයීම් කාර්යයන් සඳහා සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 200 නොඉක්මවන අතුරු ගෙවීම් සහතික අවස්ථා 15 කදී ඇගයීම් කර තිබුණි.

## 3.4 පරිබාහිර ගනුදෙනු

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කොන්ත්‍රාත්තුවට අදාළ නොවන පළාත් මාර්ග පුනරුත්ථාපනය, බාහිර පාර්ශවයන්ට අයත් පරිශ්‍රයන්හි පැති බිත්ති හා වෙනත් ගොඩනැඟිලි ඉදිකිරීම්, රු.මිලියන 22.78 ක පිරිවැයකට සිදුකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) දේපල හානි මත බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු රු.මිලියන 34.11 ක් වූ වන්දි මුදල් අධිවේගී මාර්ගයේ පාරිසරික පාලන කාර්යයන් සඳහා වෙන් කරන ලද රු.මිලියන 75 ක මුදලින් නිරවුල් කර තිබුණි.

## 3.5 ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කාර්යයන්

-----------------------------------------------------------------

අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා රු.මිලියන 71.82 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් පර්චස් 324.17 ක ඉඩමක් කඩුවෙලින් අත්කර ගෙන තිබුණු අතර රු.මිලියන 23.92 ක පිරිවැයකට සංවර්ධනය කර තිබුණි. එම ඉඩම, කැබලි 21 කට සීමා වෙන් කරන ලද අතර ඉන් කැබලි 08 ක් 2015 දෙසැම්බර් 31 වන විටත් නිෂ්කාර්යව පැවතුණු අතර, පසුව බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්කර ගෙන තිබුණි.

## 3.6 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම

-----------------------------------

2015 අප්‍රේල් මාසයේදී ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර තිබූ අතර 2015 ජුනි මාසයේ සිට මාර්ගයේ මෙහෙයුම් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණය කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය අවසන් කිරීමේ ගිණුම් පිළියෙල කර නොතිබුණි.